**සැ. යු.** : (i)   2025.09.19 දින පළ කරන ලද අංක 2452 ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,456 - 2025 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 2074 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 2100 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2071- B 82723 — (2025/09)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවතින වෛද්‍ය පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ වෛද්‍ය නිලධාරින් බඳවා ගැනීම**

පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවත්නා පහත සඳහන් වෛද්‍ය නිලධාරි පුරප්පාඩු සපුරාලීම සඳහා දැනට රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ, සේවයේ නියුතු වෛද්‍යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- විශේෂඥ ශල්‍ය වෛද්‍ය තනතුරු 01
- කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු 01
- විශේෂඥ විකිරණවේදී වෛද්‍ය තනතුරු 01
- සායනික පෝෂණය පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු 01
- නිර්වින්දන විශේෂඥ වෛද්‍ය තනතුරු 01
- සාමාන්‍ය වෛද්‍ය තනතුරු 16
- දන්ත ශල්‍ය වෛද්‍ය තනතුරු 04

02. සුදුසුකම් සපුරා ඇති වෛද්‍යවරුන් පහතින් දක්වා ඇති ආකෘති පත්‍රය අනුව, සකස් කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකවල පිටපත් ද සමඟ බහා එවනු ලබන කවරයේ වම් පස ඉහල කෙලවරෙහි ඔබ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර 2025.10.27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් අයදුම්පත්‍ර පුද්ගලිකව භාර නොදිය යුතුය.

03. **සුදුසුකම් හා පළපුරුද්ද - විශේෂඥ වෛද්‍ය (උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි)**

3.1 ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධිය ලබා තිබීම
3.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.
3.3 ක්ෂේත්‍රයට අදාළව අවම වසර 01 ක පශ්චාත් පත්වීම් පළපුරුද්ද ලබා තිබීම

04. **සුදුසුකම් හා පළපුරුද්ද - සාමාන්‍ය වෛද්‍ය (උපසේවා සහකාර පොලිස් අධිකාරි)**

4.1 M.B.B.S. හෝ ඒ හා සමාන විදේශ වෛද්‍ය උපාධියක් ලබා තිබීම.
4.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.
4.3 මේ සඳහා රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයේ ද ඕනෑම වෛද්‍යවරයකුට අයදුම්කළ හැකිය.

**05. සුදුසුකම් හා පළපුරුද්ද - දන්ත ශල්‍ය වෛද්‍ය (උපසේවා සහකාර පොලිස් අධිකාරි)**

5.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක දන්ත වෛද්‍ය උපාධියක් හෝ ඒ හා සමාන දන්ත වෛද්‍ය උපාධියක් සමත්ව තිබීම .
5.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.
5.3 **රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයේ ද ඕනෑම වෛද්‍යවරයකුට අයදුම්කළ හැකිය.**

**06.** වැටුප් හා වෙනත් දීමනා සහ පහසුකම් :

| *රාජ්‍ය සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට දීමනා හා පහසුකම්* | | *පෞද්ගලික සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට වැටුප්, දීමනා හා පහසුකම්* |
|---|---|---|
| **උප සේවා ස.පො.අ./ පො.අ./ජො.පො.අ/ (වෛද්‍ය) නිලධාරි තනතුරට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධරයන් තාවකාලිකව මුදා හැරීමේ දී ගෙවන වැටුප** | | **උප සේවා ස.පො.අ./ පො. අ. / ජො.පො.අ./ (වෛද්‍ය) නිලධාරි තනතුරට අංක අමප/15/0240/606/2013 දරන 2015.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සෘජුව වෛද්‍යවරුන් බඳවා ගැනීමේ දී ගෙවන වැටුප (සියලු වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලීසිය මඟින් ගෙවනු ලැබේ.)** |
| අදාළ වෛද්‍යවරයා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දරන නිත්‍ය තනතුරට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ගෙවනු ලබන වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලීසිය මගින් ප්‍රතිපූරණය කරනු ලැබේ. | | මූලික වැටුප :<br>උපසේවා ස.පො.අ (වෛද්‍ය) රු. 82,150<br>උපසේවා පො.අ (වෛද්‍ය) රු. 98,950<br>උපසේවා ජො.පො.අ (වෛද්‍ය) රු. 112,030 |
| අමතර සේවා දීමනාව (උපරිම පැය 120 සඳහා) සත්‍ය වශයෙන් සේවය කරනු ලබන පැය ගණන පදනම් ව ශ්‍රී ලංකා පොලීසිය මගින් ගෙවනු ලැබේ | | විශේෂ දීමනාව<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2025 අනුව වැටුපෙන් 22% ක් සමග රු. 1,250/- |
| ප්‍රවාහන පහසුකම් | | ජීවන වියදම් දීමනාව - රු. 17,800 |
| | | දුෂ්කර දීමනාව - රු. 2,000 |
| | | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව - රු. 250 |
| | | ආහාර හා නවාතැන් දීමනාව රු. 34,800 |
| | | ප්‍රවාහන පහසුකම් |

6.1 රාජ්‍ය සේවයෙන් බඳවා ගනු ලබන වෛද්‍යවරුන් පොලිස් උප සේවයේ ද්විතීයන පදනම මත ද, ඉන් පරිබාහිරව බඳවාගනු ලබන වෛද්‍යවරුන් උපසේවා පදනම මත ද බඳවාගැනීම සිදුකරනු ලබයි.

6.2 ද්විතියන පදනම මත බඳවා ගන්නා වෛද්‍යවරුන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනුලබන වැටුප් වර්ධක සහ සියලු දීමනා ලබාගැනීමට හිමිකම් ඇති අතර මෙම බඳවා ගැනීම සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් ඇති නොවේ.

6.3 උපසේවා පදනමින් බඳවා ගන්නා වෛද්‍යවරුන් හට එම තනතුරට හිමි වැටුප්, දීමනා හා පහසුකම් සපයනු ලැබේ.

6.4 ප්‍රවාහන පහසුකම් අනුමත දීමනා සහ ඒ ඒ තනතුරට අදාළ අනෙකුත් පහසුකම් සපයනු ලැබේ.

07. සේවා කොන්දේසි :

7.1 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

7.2 සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

7.3 තෝරාගනු ලබන අයදුම්කරුවන් /අයදුම්කාරියන් පත්වීම් ලැබීමට පෙර පසුබිම් පරීක්ෂණයට ලක්කරනු ලබන අතර පොලිස් සේවයට නුසුදුසුවන අයදුම්කරුවන් අයදුම්කාරියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08. අයදුම්පත සමඟ පහත සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

- **උප්පැන්න සහතිකය**
- **ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය**
- **වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත**
- **වෛද්‍ය උපාධි සහතිකය**
- **ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචි සහතිකය**
- **වෛද්‍ය වෘත්තියට අදාළ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික**

- වැඩි විස්තර සඳහා විද්‍යුත් ලිපිනය - dir.ro@police.gov.lk

ප්‍රියන්ත වීරසූරිය,
පොලිස්පති.

2025 සැප්තැම්බර් මස 14 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

01. අයදුම්කරනු ලබන තනතුර : ........................................................
02. අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ සම්පූර්ණ නම : ..............................................................
03. අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ මුලකුරු සමග නම : ........................................................
04. මුලකුරුවලින් හැඳින්වෙන නම් :..................................................................................
05. ස්ථිර ලිපිනය :..........................................................................................................
06. ස්ථිර ලිපිනයට අදාළ පොලිස් වසම : ..............................................................................
    i. ලිපිහුවමාරු ලිපිනය : ............................................................................
    ii. දුරකථන අංකය : ........................................................................
    iii. විද්‍යුත් තැපැල් ලිපිනය : ........................................................................
07. උපන් දිනය : ................................................................................
08. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................
09. ස්ත්‍රී /පුරුෂ භාවය :..................................................................................
10. දැනට සේවය කරන රෝහල : ..................................................................................
11. දැනට දරන තනතුර :..................................................................................
12. වර්තමාන තනතුරට පත්වූ දිනය :............................................................................
13. වෘත්තිය සුදුසුකම් :..................................................................................
14. විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද :..................................................................................

ඉහත සඳහන් තොරතුරු, විස්තර සත්‍ය හා නිවැරදි බවට මම සහතික කරමි. මා විසින් සපයන ලද කිසිදු තොරතුරක් අසත්‍ය බවට තෝරාගනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමට හා පත්වීම ලැබීමෙන් පසු හෝ සොයාගනු ලැබුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව පොලිස් සේවයෙන් පහකරනු ලැබීමට ද මා යටත්වන බවට දන්වා සිටිමි.

.................................................,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

09-222

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම - 2025

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2025 නොවැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**1.1.** බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | ක්ෂේත්‍ර මුරකරු | 45 | III ශ්‍රේණිය |
| 02 | ලොරි සහායක උදව්කරු | 05 | III ශ්‍රේණිය |
| 03 | පර්යේෂණාගාර සහායක | 37 | III ශ්‍රේණිය |
| 04 | රසායනාගාර කම්කරු | 18 | III ශ්‍රේණිය |
| 05 | ග්‍රීසර් | 35 | III ශ්‍රේණිය |
| 06 | සැලසුම් මුද්‍රණකරු උදව්කරු | 08 | III ශ්‍රේණිය |

**1.2.** තනතුරුවල රාජකාරි ස්වභාවය :

| *තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| ක්ෂේත්‍ර මුරකරු | I. ක්ෂේත්‍රයට අදාළ ආයතන, ගබඩා ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, වාහන ඇති ස්ථාන මුර කටයුතු කිරීම.<br>II. නඩත්තු කටයුතු අවස්ථාවල දී වැව් අමුණු ප්‍රතිසංස්කරණ කටයුතුවල දී එම ස්ථානවලට රැගෙන යනු ලබන යන්ත්‍රෝපකරණ හා බඩු බාහිරාදිය ආරක්ෂා කිරීම.<br>III. පැය 12 ක් දිවා රාත්‍රී වුවද සේවය කිරීම<br>IV. තමා භාරයේ ඇති දේපළවලට සිදුවන හානි සම්බන්ධයෙන් දැන සිටීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| ලොරි සහායක උදව්කරු | I. බඩු බෑම හා පැටවීම.<br>II. ඒවා අදාළ ස්ථානවල සුරක්ෂිතව තැන්පත් කිරීම.<br>III. බඩු බෑමෙන් පසු ලොරිය මනාව ශුද්ධ පවිත්‍ර කිරීමේ හා සේදීමේ කටයුතු<br>IV. ලොරිවල ස්නේහක යෙදිය යුතු ස්ථාන ගැන දැන ගැනීමේ හා එම ස්ථානවලට නිවැරදිව ස්නේහක යෙදීම.<br>V. ලොරි ක්‍රියාකරුගේ රාජකාරියට සහාය වීම හා වාහනය අවශ්‍ය අවස්ථාවල ආරක්ෂා කිරීම.<br>VI. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

| තනතුරු නාමය | කාර්යයන් |
|---|---|
| පරේශ්‍ෂණාගාර සහායක | I. රසායනාගාරයට රැගෙන එන යන්ත්‍ර සූත්‍ර, මෙවලම් ගල්, වැලි, පස් ගඩොල්, යකඩ වැනි ඉංජිනේරුමය ද්‍රව්‍ය හා කොන්ක්‍රීට් ගණක සාම්පල නියමිත ආකාරයන් සෑම විටම ප්‍රවාහනය කරන යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් එම ස්ථානවල ස්ථාපනය කිරීම.<br>II. රසායනාගාරයට ගෙන එනු ලබන පස් හා ජල සාම්පල් රසායනාගාර සහකාර නිලධාරින්ගේ උපදෙස් මත ඇසුරුම් කිරීම හා සැකසීම.<br>III. විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා කරන උපකරණ, වීදුරු භාණ්ඩ, රසායන ද්‍රව්‍යයන් අදාළ ස්ථානවලට රැගෙන යාම හා ඇසුරුම් කිරීම.<br>IV. ක්ෂේත්‍ර රාජකාරිවලට අදාළ භූ විද්‍යා සමීක්ෂණ හෝ සිමෙන්ති හා වැට් දියර කැපීමේ කටයුතු හෝ මතුපිට සිමෙන්ති ආස්තරණ කටයුතුවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා සියලුම උපකරණ හා ආයුධ හඳුනා ගැනීම හා ඒවායේ දෝෂ නිවැරදි කිරීම.<br>V. විදුම් යන්ත්‍ර, ජල පොම්ප හා වෙනත් යන්ත්‍ර ස්ථාපනය කිරීම හා අවශ්‍යතාවය අනුව අධි පීඩන ජල පද්ධති සකස් කිරීමේ හැකියාව.<br>VI. පර්යේෂණ ආකෘති, ඉදි කිරීම් ආකෘති, අධ්‍යයන කටයුතුවලට නිලධාරියාට සහාය වීම. වැඩබිම්වල මූලික සැකසීම් කටයුතු කිරීම.<br>VII. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| රසායනාගාර කම්කරු | I. පරේශ්‍ෂණාගාරවල / ක්ෂේත්‍රයෙහි නියැදීන් පිළියෙල කිරීම / ලබා ගැනීම සඳහා සහාය වීම.<br>II. නියැදීන් පරීක්ෂා කරන අවස්ථාවල අවශ්‍ය සහාය ලබා දීම.<br>III. උපකරණ හා යන්ත්‍ර දෙනිකව / පරීක්ෂණවලින් පසු පිරිසිදු කිරීම.<br>IV. පරීක්ෂණාගාරය සහ අවට පරිසරය පවිත්‍රව තබා ගැනීම.<br>V. නියැදීන් / උපකරණ /මෙවලම් ප්‍රවාහනයේ දී සහාය වීම<br>VI. අවශ්‍ය අවස්ථාවල දී උසස් නිලධාරින්ගේ උපදෙස් පරිදි කටයුතු කිරීම.<br>VII. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| ග්‍රීසර් | I. යන්ත්‍රවලට , වාහනවලට ග්‍රීස් / ලිහිසි තෙල් යෙදිය යුතු ස්ථාන හඳුනාගෙන නිසි අවස්ථාවල ඒවා යෙදීම.<br>II. යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ දී කාර්මිකයින්ට සහාය දීම.<br>III. යන්ත්‍ර පිරිසිදු කිරීම හා ආරක්ෂා කිරීම.<br>IV. ක්‍රියාකරුට සහාය වීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| සැලසුම් මුද්‍රණකරු / උදව්කරු | I. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ සියළුම සැලසුම්පත් හා පිඹුරුපත් මුද්‍රණය කිරීම.<br>1. මුද්‍රණ කටයුතු ලේඛනගත කර එම ලේඛන යථාවත් කිරීම.<br>2. එම මුද්‍රණ යන්ත්‍ර ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම.<br>II. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ රිසෝ මුද්‍රණයන් කිරීම.<br>1. මුද්‍රණ කටයුතු ලේඛනගත කර එම ලේඛන යථාවත් කිරීම.<br>2. එම මුද්‍රණ යන්ත්‍ර ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම.<br>III. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ ඕෆ් සෙට් මුද්‍රණයන් කිරීම.<br>1. මුද්‍රණ කටයුතු ලේඛනගත කර එම ලේඛන යථාවත් කිරීම.<br>2. එම මුද්‍රණ යන්ත්‍ර ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම.<br>IV. ලැමිනේටින් කිරීම හා පොත් ලිපිගොනු බයින්ඩ් කිරීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

02. **බඳවා ගැනීමේ ක්‍රමය :**
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනේ. එම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක භාවිතා කරමින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| පළපුරුද්ද | 40 |
| වෘත්තීය සුදුසුකම් | 20 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| **එකතුව** | **100** |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගත් කුසලතාවයේ අනුපිළිවෙළ මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**03. වැටුප් පරිමාණය :**
2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි PL 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය **රු.40,000-10X450-10X490-12X540-12X590-රු.61,880/-** වේ.

එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම පත්වීම ස්ථිරය. එතකුදු වුවත් ඔබ වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

III. අදාළ තනතුරේ ස්ථිර කිරීම සඳහා III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයන් නියමිත කාලය තුළ ලබා ගත යුතුය.

V. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන හා එයට වරින්වර කරනු ලබන සංශෝධනවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලැබේ.

**05. වයස් සීමාව :**
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**06. අවශ්‍ය සුදුසුකම් :**

6.1 අධ්‍යාපන සුදුසුකම් -
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම;

*හෝ*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 අනුව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 3) සම්පූර්ණ කර තිබීම.

6.2 වෘත්තීය සුදුසුකම් -
තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

6.3 පළපුරුද්ද -
තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

6.4 කායික සුදුසුකම් -
සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.5. වෙනත් සුදුසුකම් -

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරුවන් 05 හා 06 ඡේදවල සඳහන් සුදුසුකම් **2025 ඔක්තෝබර් 26 දිනට හෝ ඊට පෙර** සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඇමිණිය යුතුය.

7. **අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :**

I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී 21X29 ( ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1 සිට 3 දක්වා පළමු පිටුවේද, අංක 4 සිට 5 දක්වා දෙවන පිටුවේද ,අංක 6 සිට 8 දක්වා තෙවන පිටුවේද, අංක 9 සිව්වන පිටුවේ ද ඇතුළත්වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

II. අයදුම්පත් සකස් කළ යුත්තේ තමා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් පමණි.

III. තනතුරු එකකට වැඩි ප්‍රමාණයක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

IV. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී එක් අයදුම්පතක් සඳහා අයදුම්පත් හා සම්මුඛ පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 500/- ක මුදලක් ගෙවීම අනිවාර්ය වේ. එය ලංකා බැංකුව, රෝහල පාර, කොළඹ 01, තැපොබේන් ශාඛාවේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 7042385 දරන ගිණුමට බැරවන පරිදි ගෙවා රිසිට් පත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතුය.

V. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

VII. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නිකුත් කරන ලිපිය අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VIII. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කරවාගෙන යොමු කළ යුතු ය.

IX. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව **ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ................. තනතුර (උදා :- ක්ෂේත්‍ර මුරකරු, ලොරි සහායක උදව්කරු) සඳහා විවෘත පදනමින්** බඳවා ගැනීම **- 2025** යනුවෙන් පැහැදිලිව සඳහන් කර **2025 ඔක්තෝබර් 26 දින හෝ ඊට පෙර** වාරිමාර්ග අධ්‍යක්ෂ **ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අංක 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතුය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීම :**
අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අයදුම්පත්‍රය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් පත්වීම අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. **සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම :**
**2025 නොවැම්බර් මස කොළඹ දී** පමණක් සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

ඉංජි. අජිත් ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2025 සැප්තැම්බර් මස 25 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ .................(III) තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2025

**The Application for the Open Basis Recruitment to the Post of the Service Category of Primary Level Unskilled ……………………….. (III) in the Irrigation Department -2025**

සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1

දෙමළ - 2

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : ……………………………………………………………….
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 අයදුම්කරුගේ මුලකුරු සමග නම : ……………………………………………………………….
(සිංහලෙන් / දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම : ………………………………………………………………..
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම :…………………………………………………………………...
(සිංහලෙන් / දෙමළෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.6 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී 1

පුරුෂ 2

2.0 2.1 ස්ථිර ලිපිනය :
……………………………………………………………………………………………………
.....................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :…………………………………………………………………………………
(සිංහලෙන් / දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

(1) සිංහලෙන් / දෙමළෙන් : ………………………………………….......................………..

(11) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ………………………………………………...............................

2.4 දුරකථන අංකය (පෞද්ගලික) : ……………………………….................…

3.0 3.1 විවාහක / අවිවාහක බව :

විවාහක -2 අවිවාහක -1 [ ]

3.2 උපන් දිනය :
(අදාළ කොටුව තුළ ලියන්න.)

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

වර්ෂ [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ? ................................................................
..

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස.(සා/පෙ) විභාගය :
1. විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : ................. මාසය : .................
11. විභාග අංකය : ..............................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස.(සා/පෙ) විභාගය :-
1. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය : ................. මාසය : .................
11. විභාග අංකය : ..............................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.3 වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :

……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………

5.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න )

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන්න තොරතුරු සපයන්න :

……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………………

6.0 මුදල් ගෙවීම් කුවිතාන්සිය :

කුවිතාන්සි අංකය ……………………………………… දිනය ………………………………………

| කුවිතාන්සිය මෙහි අලවන්න |
|---|

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි පාඩුව විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තව ද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි;

(ආ) සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ මාගේ අයදුම්පත්‍රය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි;

(ඇ) මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට පෙර නුසුදුස්සකුවන බවත්, පත්වීම ලැබීමෙන් පසු වුව ද සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි;

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ………………………… …………………………
අයදුම්කරුගේ අත්සන

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................................................... මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ...................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.......................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

දිනය : ..........................
සහතික කරන නිලධාරියාගේ නම : .............................................
තනතුර : ...........................................................
ලිපිනය : ...........................................................

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණක් අදාළ වේ.)

...............................................................................මයා/ මිය/ මෙනවිය,................................................ සේවයේ නියුතු .................................................................... තනතුර දරන නිලධාරියකු බවත්, ඔහු/ ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ ඇය තෝරාගනු ලැබුවහොත්, .................................................. සේවයෙන් ඔහු/ ඇය මුදාහැරිය හැකි/ නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

.....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය : ..........................................

09-295

---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම - 2025**

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2025 නොවැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**1.1.** බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | ක්‍රියාකරු | 39 | III ශ්‍රේණිය |
| 02 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 8 | III ශ්‍රේණිය |
| 03 | විදුලි කාර්මික | 7 | III ශ්‍රේණිය |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|
| 04 | කාර්මික ශිල්පී | 22 | III ශ්‍රේණිය |
| 05 | පෑස්සුම්කරු | 3 | III ශ්‍රේණිය |
| 06 | බෙලෙක් වැඩකරු | 11 | III ශ්‍රේණිය |
| 07 | පින්තාරුකරු | 5 | III ශ්‍රේණිය |
| 08 | ලියවන පට්ටල්කරු | 2 | III ශ්‍රේණිය |
| 09 | සවිකරන්නා | 4 | III ශ්‍රේණිය |
| 10 | යන්ත්‍රකරු | 4 | III ශ්‍රේණිය |
| 11 | කම්මල්කරු | 3 | III ශ්‍රේණිය |
| 12 | නඩත්තු හා මෙහෙයුම් කම්කරු | 63 | III ශ්‍රේණිය |
| 13 | ජල පොම්ප ක්‍රියාකරු | 10 | III ශ්‍රේණිය |
| 14 | පෙදරේරු | 6 | III ශ්‍රේණිය |
| 15 | වඩු කාර්මික | 4 | III ශ්‍රේණිය |
| 16 | ජල නළ කාර්මික | 1 | III ශ්‍රේණිය |
| 17 | උපකරණ ශිල්පී | 1 | III ශ්‍රේණිය |
| 18 | උපකරණ අලුත්වැඩියාකරු | 2 | III ශ්‍රේණිය |
| 19 | ජල විද්‍යා මිනුම් සහායක | 26 | III ශ්‍රේණිය |
| 20 | සංචාරක බංගලා භාරකරු | 5 | III ශ්‍රේණිය |
| 21 | ගබඩා කම්කරු(ගබඩා සහායක) | 30 | III ශ්‍රේණිය |
| 22 | වැද්දුම්කරු | 2 | III ශ්‍රේණිය |

**1.2. තනතුරුවල රාජකාරි ස්වභාවය :**

| තනතුරු නාමය | කාර්යයන් |
|---|---|
| ක්‍රියාකරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ලොරි, ක්‍රෝලර්, ට්‍රැක්ටර්, රබර් ටයර් සහිත ට්‍රැක්ටර්, ඩම්ප් ට්‍රක්, බකට් ස්ක්‍රේපර්, රෝඩ් රෝලර් මෝටර් ග්‍රේඩර්, බර පටවන ලොඩර්, බැක්හු එක්ස්කැවේටර් වර්ග (ෂවර්/ඩ්‍රැග් ලයින්/බැක්හු/ ක්ලැම් ෂෙල්/ ක්‍රේන්/ෆයිල් ඩයිවර්) ඩෝසර් යන යන්ත්‍රවලින් ඕනෑම යන්ත්‍ර 3ක් ක්‍රියා කරවීම පිළිබඳව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම:-<br><br>I. සර්විස් කිරීම හා වැරදි සොයා ගැනීම ඇතුලුව එය ක්‍රියාකරවීම ආරක්ෂා කිරීම හා තබා ගැනීම පිළිබඳව දැනීමක් තිබීම;<br><br>II. පස් අදින උපකරණ හා යන්ත්‍ර ක්‍රියාකරවන්නන් සඳහාවන සියලුම පරීක්ෂණවල දී යන්ත්‍රය කාර්යක්ෂම ලෙස ක්‍රියාකරවීමට හැකිවීම;<br><br>III. විශේෂ ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ අදාළ යන්ත්‍රය භාවිතය පිළිබඳ දැනුමක් තිබීම;<br><br>IV. පස් බුරුල් කිරීමට, පස් කැපීමට, පැටවීමට, තල්ලු කිරීමට හා ඇදීමට භාවිතා කරනු ලබන උපකරණ පිළිබඳව දැනීමක් තිබීම;<br><br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | I. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රාජකාරිවලට අනුකූලව ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන ට්‍රැක්ටර් රථ ක්‍රියා කරවීම |
| | II. | ට්‍රැක්ටර් හා ටේලර් රථ සර්විස් කිරීම, වැරදි සොයා ගැනීම ඇතුළුව ඒවා ක්‍රියාකරවීම, ආරක්ෂාකාරීව තබා ගැනීම පිළිබඳ දැනුමක් තිබීම |
| | III. | ට්‍රැක්ටර් රථ පැදවීම, ට්‍රේලරයට බර පැටවීම හා එම බර බෑම යනා දී සියලුම පරීක්ෂණවල දී කාර්යක්ෂම ලෙස ක්‍රියා කරවීමට හැකි වීම |
| | IV. | කඳු බෑවුම්, වගුරු බිම් වැනි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ක්‍රියා කරවීම පිළිබඳ හැකියාවක් තිබීම |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| විදුලි කාර්මික | I. | 1/64" පරිමාණයන් කියවීමට පුලුවන් වීම |
| | II. | වෘත්තියට අදාළ ආයුධවල නම් භාවිතය හා ඒවා තබාගැනීම පිළිබඳ දැනීම |
| | III. | සරල රූප සටහන් කියවා තේරුම් ගැනීමට පුලුවන් වීම |
| | IV. | මෝටර් රථයක තිබෙන විදුලි කොටස් පිළිබඳ දැනීම |
| | V. | සියලු වැඩවල දී පිළිපැදිය යුතු ආරක්ෂක උපදෙස් පිළිබඳ දැනීම |
| | VI. | වයර් කිරීමේ වැඩ ( විදුලි ජේනු ) පිළිබඳ දැනීම |
| | VII. | සියලුම වර්ගවල ගෘහ සේවා මීටර් කියවීමට හා උපරිම ඉල්ලුම් සුචක නැවත සකස් කිරීමට පුලුවන් වීම |
| | VIII. | දෙපාර්තමේන්තුවේ පිළිපදින ආරක්ෂාව පිළිබඳ සියලු නීති සම්බන්ධයෙන් ප්‍රවීණතාවයක් තිබීම |
| | IX. | ගණක මීටරවල ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා දැනීම |
| | X. | සරල ගණනය පිළිබඳ දැනීම |
| | XI. | යන්ත්‍ර, වාහන, ශෘහස්ථ විදුලි පරිපථ පිළිබඳ අලුත්වැඩියාවන්, දෝෂ හා ඒවාට හේතු සොයා ගැනීමේ හැකියාව පිළිබඳ පළපුරුද්දක් තිබීම |
| | XII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| කාර්මික ශිල්පී | I. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවත්නා මෝටර් වාහන, යන්ත්‍ර සූත්‍ර, පොම්පාගාර සහ විවිධාකාර මැෂින්වලට අවශ්‍යවන අලුත්වැඩියාවන් කිරීම. |
| | II. | දෝෂයන් ඇති අවස්ථාවල දී එම දෝෂයන් සොයා ගැනීමේ අවශ්‍යතාවය හා හැකියාව. |
| | III. | දෝෂයන් පවත්නා උපාංග සොයා ගැනීමේ හැකියාව සහ එම උපාංග මිල දී ගැනීම හෝ අලුත්වැඩියාව සඳහා නිර්දේශ කිරීම. |
| | IV. | අලුත් උපාංග යොදා එම දෝෂයන් යථා තත්ත්වයට පත්කිරීමේ හැකියාව. |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

| *තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| පෑස්සුම්කරු | I. පෑස්සුම් වැඩවල දී භාවිතා කරන විවිධ වර්ගවල උපකරණ ඒවාට අදාළ කාර්යයන් සඳහා නිවැරදිව භාවිතා කරමින් පෑස්සුම් කටයුතු සිදුකිරීම.<br>II. යකඩ හා යකඩ නොවන ලෝහවල වෙනස හඳුනාගෙන ඒ අනුව නිවැරදි පෑස්සුම් කටයුතු සිදු කිරීම.<br>III. පෑස්සුම් කටයුතු සිදු කිරීමේ දී යෙදිය යුතු ආරක්ෂක උපදෙස් නිසි පරිදි භාවිතා කිරීම.<br>IV. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| තහඩුවැඩකරු (බෙලෙක් වැඩකරු) | I. 1/32" පරිමාණයන් කියවීමට හැකිවීම.<br>II. වෘත්තියෙහි දී භාවිතා කෙරෙන විවිධ ලෝහ වර්ග පිළිබඳ මනා දැනීමක් තිබීම.<br>III. ඊයම්වලින් පෑස්සීම, වෙනත් ලෝහවලින් පෑස්සීම හා රිවට් කිරීම පිළිබඳ මනා දැනුමක් තිබීම.<br>IV. වාත්තු කරන වක්‍ර කපන යන්ත්‍ර ක්‍රියා කරවීමට හැකිවීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| පින්තාරුකරු | I. කියවීමට හා ලිවීමට පුලුවන් වීම.<br>II. පින්තාරු කරන ලද පරණ පෘෂ්ඨ ධමන ලාම්පුව, සීරීම හා පින්තාරු ඉවත්කරනය යන ක්‍රම මගින් ශුද්ධ කිරීමට පුලුවන් වීම.<br>III. විවිධ වර්ගවල තීන්ත හා වාර්නිෂ් පිළිබඳ මූලික දැනුම<br>IV. ලෝහමය ලී හා පෘෂ්ඨ ශුද්ධ කර පින්තාරු කිරීමට හා පින්තාරු කරන උපකරණ සියල්ලම භාවිතා කිරීමට හැකියාව තිබීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ලියවන පට්ටල්කරු | I. පට්ටල් වැඩ සඳහා අදාළවන ආයුධ හඳුනා ගැනීම.<br>II. ලියවන පට්ටල්වලින් කෙරෙන කාර්යයන් පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කිරීම.( කැපීමේ වේග හා පීඩ් පිළිබඳ වක්‍ර යෙදීම ඇතුළුව )<br>III. පට්ටල් වැඩ සඳහා ලබාදෙන සරල ඇඳීම් කියවීම.<br>IV. ව'නියර් හා මයික්‍රොමීටර්වලින් මිණුම් කියවීම හා ඒ අනුව පට්ටල්වලින් ලියවීම ( කැපීම ) සිදුකිරීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| සවිකරන්නා | I. 1/64" පරිමාණයන් කියවීමට හා භාගවලින් දැක්වෙන දිග පළල ආදිය සටහන් කිරීම, සූක්ෂම මානය කියවීම පිළිබඳ දැනුම.<br>II. තම වෘත්තියට අදාළවන සියලුම ආයුධවල නම් භාවිතය හා තබා ගැනීම පිළිබඳ මනා දැනීමක් තිබීම |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| | III. | වාෂ්ප මොටෝ ඩීසල් හා විල්රයිට් බඳු විශේෂ ආකාරවල වැද්දුම් වැඩ පිළිබඳ මනා දැනීමක් තිබීම |
| | IV. | කාර්යක්ෂම අයුරින් සැසීමට හා පීරිගෑමට හැකිවීම |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| යන්ත්‍රකරු | I. | මිලින් මැෂින්, ග්‍රයින්ඩින් මැෂින්, ෂේපින් මැෂින්, බෝරින් මැෂින් යනාදී දෙපාර්තමේන්තු කම්හල් තුළ භාවිතා කරන යන්ත්‍ර අතරින් යටත් පිරිසෙයින් යන්ත්‍ර දෙකක්වත් කාර්යක්ෂමව ක්‍රියා කරවීම. |
| | II. | ඉහත යන්ත්‍ර සඳහා සවිවන විවිධ උපාංග සවිකර ක්‍රියා කරවීම |
| | III. | ඉහත යන්ත්‍ර සඳහා අදාළවන විවිධ ආයුධ පරිහරණය කිරීම. |
| | IV. | ඉහත යන්ත්‍ර වලින් සිදු කරගන්නා කාර්යයන් සඳහා ලබාදෙන සරල ඇඳීම් කියවීම. |
| | V. | වර්නියර්, මයික්‍රෝමීටර්වලින් මිනුම් කියවීම හා එම මිනුම්වලට අදාළ ව ඉහත යන්ත්‍ර භාවිතයෙන් අවශ්‍ය කාර්යය නිමා කිරීම. |
| | VI. | දෙපාර්තමේන්තුවට අයත් තම සේවය කරන කම්හල තුළ සවිකර ඇති ඉහත යන්ත්‍ර හා ඒ සඳහා භාවිතා කරන අනෙකුත් සවිකිරීම් හා උපාංග තමා භාරයේ තබාගෙන පාවිච්චි කිරීම හා ආරක්ෂා කිරීම. |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| කම්මල්කරු | I. | කියවීමට හා ලිවීමට පුලුවන් වීම. |
| | II. | කම්මල් වැඩ සඳහා අවශ්‍ය ආයුධ පිළිබඳ දැනීම |
| | III. | සිය වෘත්තියට අදාලවන ආයුධවල නම් භාවිතය හා ඒවා තබාගැනීම පිළිබඳව පුරුද්දක් තිබීම. |
| | IV. | වෘත්තියේ දී බෙහෙවින් පාවිච්චි කෙරෙන ලෝහ වර්ග හා අනෙකුත් ද්‍රව්‍ය පිළිබඳ දැනුමක් තිබීම. |
| | V. | ගිනි උදුන් ගොඩනගන හා තබා ගන්නා ආකාරය පිළිබඳ දැනුමක් තිබීම. |
| | VI. | සාමාන්‍ය ලෝහ තැලීම පිළිබඳ දැනීමක් තිබීම |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| නඩත්තු හා මෙහෙයුම් කම්කරු | I. | මහා/මධ්‍යම පරිමාණ ජලාශවල වැව්බැම්ම, සොරොව්ව, වාන් නිර්මිතවල නඩත්තු කටයුතු හා මෙහෙයුම් නිතිපතා කිරීම. |
| | II. | ජල පාලන කටයුතුවල නිරත වීම. |
| | III. | මෝසම් වැසි සහිත කාලවල වාරිමාර්ග පද්ධති මූලස්ථායි වැඩ හා වාරිමාර්ග පද්ධති ගංවතුරින් ආරක්ෂා කර ගැනීම, වාරිමාර්ග පාලන දොරටු නිසි පරිදි ආරක්ෂා සහිතව විවෘත කිරීම. |
| | IV. | ප්‍රධාන හා බෙදුම් ඇළ මාර්ග කැළෑ ශුද්ධ කිරීම, සුළු පරිමාණ අළුත්වැඩියාවන්, දොරටු වල යාන්ත්‍රික කොටස් තෙල් හා ග්‍රීස් යෙදීම, මළ ඉවත් කරන තීන්ත ආලේප කිරීම. |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| නඩත්තු හා මෙහෙයුම්කරු | V. | කෘෂි කාර්මික මාර්ග හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් හා නඩත්තු කිරීම් කටයුතු කිරීම. |
| | VI. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ජල පොම්ප ක්‍රියාකරු | I. | පොම්පය නිසි පරිදි ක්‍රියා කරවීම. |
| | II. | විදුලිය පිළිබඳ ආරක්ෂණ ක්‍රම පිළිබඳ දැන ගැනීම. |
| | III. | පොම්පය පණ ගැන්වීම හා නැවැත්වීම. |
| | IV. | පොම්පය සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් යෙදීම. |
| | V. | පොම්පවල සුළු කාර්මික දෝෂයන් අලුත්වැඩියා කිරීම. |
| | VI. | පොම්පාගාරයේ සවිකර ඇති විදුලි මෝටර් සහ එන්ජින් ක්‍රියාකරවීම. |
| | VII. | දිවා හෝ රාත්‍රී වශයෙන් මුරසේවා දෙකක් යටතේ කටයුතු කිරීමට හැකිවීම. |
| | VIII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| පෙදරේරු | I. | ඉදිකිරීමට අදාළ නිර්මිත සඳහා වූ සටහන් කියවීම. |
| | II. | ඉදිකිරීමට අදාළ නිර්මිත වූ සටහන් ලියා ඉදිරිපත් කිරීමට හැකිවීම |
| | III. | ගඩොල් 1/20 සම්පූර්ණ ගඩොලට හා ගඩොලට 1 ½ ට සාදනු ලබන සාමාන්‍ය මුලු හා උළුවහු ඇතුළත් ගඩොල් නිර්මිත ඉදිකිරීමට හැකිවීම. |
| | IV. | සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන කපරාරු මිශ්‍රණ පිළියෙල කිරීම හා කපරාරු කිරීමට හැකිවීම. |
| | V. | සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන කොන්ක්‍රීට් මිශ්‍රණ පිළියෙල කිරීම හා ඒවායින් නිර්මිත ඉදිකිරීම් කිරීමට හැකිවීම. |
| | VI. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| වඩු කාර්මික | I. | කියවීමට හා ලිවීමට හැකිවීම |
| | II. | 1/16" පරිමාණයන් කියවීමට හැකිවීම. |
| | III. | දැව නිර්මාණ ආශ්‍රිතව ඔහුව යෙදවීමට බලාපොරොත්තුවන ආකාරයේ වැඩ පිළිබඳ මනා පුරුද්දක් තිබීම. |
| | IV. | විවිධ වර්ගවල ලීවල ගුණ හා භාවිතය පිළිබඳ දැන සිටීම. |
| | V. | විවිධ වර්ගවල පිරිද්දුම්වල නම් හා භාවිතය ද ඒවා සකස් කරන ආකාරය ද දැන සිටීම. |
| | VI. | සිය වෘත්තියට අදාළ වන සරල ඇඳීම් කියවීමට හැකියාවක් තිබීම. |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| ජල නළ කාර්මික | I. | ජල නළ හා උපාංග සවිකිරීම. |
| | II. | ජල නළ හා උපාංග නඩත්තු කිරීම. |
| | III. | ජල නළ පද්ධති හා අදාල අවශ්‍ය කොටස් සෑදීම |
| | IV. | වාරිමාර්ග අධ්‍යක්ෂ ( ජල ශක්ති/ප්‍රධාන ඉංජිනේරු/වාරිමාර්ග ඉංජිනේරු/උපකරණ අධිකාරි/සහකාර උපකරණ අධිකාරි/පරේශ්‍ෂණ සහකාර) විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී. |
| උපකරණ ශිල්පී | I. | මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීම, නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කිරීම හා නඩත්තු කිරීම |
| | II. | අනෙකුත් උපකරණ අලුත්වැඩියා කිරීම හා නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කිරීම හා නඩත්තු කිරීම |
| | III. | උපකරණ අලුත්වැඩියා කිරීමේ දී අදාළ කොටස් අවශ්‍ය කොටස් සෑදීම |
| | IV. | ජලශක්ති අංශයේ ඉහළ නිලධාරින්ගේ උපදෙස් අනුව උපකරණ අලුත්වැඩියාකරුවන් හට උපකරණ අලුත්වැඩියාවන්හිදී ඇතිවන ගැටළු සඳහා උපදෙස් ලබාදීම. |
| | V. | වාරිමාර්ග අධ්‍යක්ෂ ( ජල ශක්ති/ ප්‍රධාන ඉංජිනේරු/වාරිමාර්ග ඉංජිනේරු/ උපකරණ අධිකාරි/සහකාර උපකරණ අධිකාරි/පරේශ්‍ෂණ සහකාර) විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| උපකරණ අලුත්වැඩියාකරු | I. | සූක්ෂම මානයන් කියවීමට පුලුවන් වීම. |
| | II. | මීටරයක ක්‍රියාකාරීත්වය හා සම්බන්ධයෙන් ක්‍රියාකාරීවන මූලධර්ම පිළිබඳ සාමාන්‍ය හැඟීමක් තිබීම. |
| | III. | දෝෂ සහිත ඕනෑම මීටරයක හෝ ගේජ් එකක තිබෙන දෝෂය සොයාගෙන එය හරි ගැස්සවීමට පුලුවන් වීම. |
| | IV. | 1/32" පරිමාණයන් හා වෙනත් තම වෘත්තියට අදාළ පරිමාණයන් කියවීමට හැකිවීම. ව්‍යාපෘතියේ දී භාවිතා කරන සුළු සුළු ආයුධවල භාවිතය පිළිබඳ දැනීමක් තිබීම. |
| | V. | අදාළවන මෙවලම් හා ගේජ් වර්ග හඳුනා ගැනීමට පුලුවන් වීම. |
| | VI. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ජල විද්‍යා මිනුම් සහායක | I. | තම සේවා මුරය තුළ සෑම පැයකට වරක් හෝ උපදෙස් දී ඇති පරිදි වෙනස් කාල පරාසයන් තුළ හෝ අදාළ ගංගාවල ජල මට්ටම් කියවා ලකුණු කිරීම. |
| | II. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාරවරුන් විසින් විසර්ජන මිනුම් සහ අනෙකුත් භූගෝලීය මිනුම් කරන අවස්ථාවල අවශ්‍ය සියලුම සහය ඔවුන්ට ලබාදීම. |
| | III. | ජල මිනුම් ස්ථානවල සවිකර ඇති සහ එම ස්ථානයට නිකුත් කර ඇති සියලුම රජයේ උපකරණ සහ ද්‍රව්‍යවලට ආරක්ෂාව සැලසීම සහ ඒවා මනාව නඩත්තු කිරීම |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| ජල විද්‍යා මිනුම් සහායක | IV. | ජල මිනුම් ස්ථානයට අයිති භූමිය, ගොඩනැගිලි, මිනුම් කණු මනාව නඩත්තු කර පිරිසිදුව තබා ගැනීම. |
| | V. | ජල මිනුම් ස්ථානයට අයිති වෙනත් කාලගුණික උපකරණ ඇත්නම් ඒවායේ මිනුම් කියවා වාර්තාගත කිරීම. |
| | VI. | ක්ෂේත්‍ර ගංගා ජල මිනුම් සහ වර්ෂාමාපක දත්තයන් ජල විද්‍යා අංශයෙන් පිළියෙල කර සපයන ලද මුද්‍රිත පෝරමවල ලකුණු කිරීම. |
| | VII. | ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ගංගාවල දිග, පළල මට්ටම ගැනීම වැනි මිනුම් කටයුතු කිරීමේ දී අවශ්‍ය සහය ලබා ගැනීම. |
| | VIII. | ගුවන් විදුලි පණිවිඩ හුවමාරු යන්ත්‍ර ක්‍රියා කරවීම. |
| | IX. | හදිසි තත්වයක දී එනම් උපකරණ ක්‍රියාවිරහිතවීමක දී හෝ තදබල වර්ෂාපතනයක දී හෝ ගංවතුර තත්වයක දී ඒ බව ජල විද්‍යා අංශය වෙත දැනුම් දීම. |
| | X. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| සංචාරක බංගලා භාරකරු | I. | සංචාරක බංගලාව පිරිසිදු කර පවත්වා ගැනීම. |
| | II. | සංචාරක බංගලාව, එහි පරිශ්‍රය හා ඊට ආනුෂාංගිකවන සියළු දේපළ ආරක්ෂා කිරීම හා නිසි පරිදි නඩත්තු කිරීම. |
| | III. | සංචාරක බංගලාවට පැමිණෙන නීත්‍යානුකූල ආගන්තුකයන්ට අදාළ පරිදි නවාතැන්, ආහාර පාන හා වෙනත් සුදුසු පහසුකම් සැලසීම. |
| | IV. | රාජකාරියට අදාළ බිල් පොත්, ලේඛන යනාදිය නිසි පරිදි පවත්වාගෙන යාම හා අධීක්ෂණ නිලධාරියා වෙත සුදුසු අවස්ථාවල ඉදිරිපත් කිරීම. |
| | V. | සංචාරක බංගලාවට අයත් බඩු බාහිරාදිය භාරව සිටීම |
| | VI. | මෙම තනතුර පැය 24ම වගකීම දරන අදාළ පරිශ්‍රයේ පදිංචිව රාජකාරි කළ යුතු තනතුරක් වේ. |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ගබඩා කම්කරු (ගබඩා භාරකරු) | I. | බඩු පැටවවීම, බෑම, හෝ එසවීම, අට්ටි ගැසීම හෝ තැන්පත් කිරීම හා ඇසිරීම. |
| | II. | ගබඩාවේ ඇති භාණ්ඩ හඳුනා ගැනීම. |
| | III. | ගබඩාවල ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ අමතර කොටස් භාවිතයෙන් පසු ඉවත් කරන තෙක් රඳවා ගත යුතු අබලි ද්‍රව්‍ය සුරක්ෂිතව තබා ගැනීම. |
| | IV. | ගබඩා භාරකරුගේ රාජකාරි කටයුතුවලට හා ලේඛන පවත්වා ගැනීමට සහාය දීම. |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

| තනතුරු නාමය | කාර්යයන් |
|---|---|
| වැද්දුම්කරු | I. 1/64" පරිමාණයන් කියවීමට හා භාගවලින් දැක්වෙන දිග පළල ආදිය සටහන් කිරීම, සූක්ෂම මානය කියවීම පිළිබඳ දැනුම.<br>II. තම වෘත්තියට අදාළවන සියලුම ආයුධවල නම් භාවිතය හා ඒවා තබා ගැනීම පිළිබඳ දැනීමක් තිබීම.<br>III. වාෂ්ප මොටෝ ඩීසල් හා විල්රයිට් බඳු විශේෂ ආකාරවල වැද්දුම් වැඩ පිළිබඳ මනා දැනීමක් තිබීම.<br>IV. කාර්යක්ෂම අයුරින් සැසීමට හා පීරිගැමට හැකිවීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ. එම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක භාවිතා කරමින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 25 |
| පළපුරුද්ද | 40 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| **එකතුව** | 100 |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගත් කුසලතාවයේ අනුපිළිවෙළ මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**03.** **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි PL 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය
රු. 41,800-10X490-10X540-12X590-12X630- රු.65,560/- වේ.

එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**04.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම පත්වීම ස්ථිරය. එතකුදු වුවත් ඔබ වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

III. අදාළ තනතුරේ ස්ථිර කිරීම සඳහා III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවන් නියමිත කාලය තුළ ලබාගත යුතුය.

V. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන හා එයට වරින්වර කරනු ලබන සංශෝධනවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලැබේ.

**05. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**06.අවශ්‍ය සුදුසුකම් :**

6.1 අධ්‍යාපන සුදුසුකම් -

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.;

*හෝ*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 අනුව ජාතික වෘත්තීය සුදුසුකම (NVQ 3) සම්පූර්ණ කර තිබීම.

6.2 වෘත්තීය සුදුසුකම් -

| *තනතුරු නාමය* | *තනතුරට අදාළ ශිල්පීය නිපුණතා* |
|---|---|
| ක්‍රියාකරු | I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.(යන්ත්‍රෝපකරණ පිළිබඳ)<br>II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ A පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.<br>III. බර වාහන හා යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම, නඩත්තු කිරීම පිළිබඳව අවම වශයෙන් අවු.03ක ප්‍රායෝගික පුහුණුවක් තිබීම. |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ A පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. |
| විදුලි කාර්මික | I. යන්ත්‍ර හා වාහනවල විදුලිමය අලුත්වැඩියාවන් පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක NVQ 2 හෝ ඊට ඉහළ මට්ටමේ විදුලි කාර්මික ශිල්පය පිළිබඳ මාස 06ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබා තිබීම;<br>II. මෙකාට්‍රොනික් පිළිබඳව මාස 06ක පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම. |
| කාර්මික ශිල්පි | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් යන්ත්‍ර හා වාහන අලුත්වැඩියාව සම්බන්ධයෙන් ලබාගෙන තිබීම. |
| පැස්සුම්කරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් පැස්සුම් ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |

| *තනතුරු නාමය* | *තනතුරට අදාළ ශිල්පීය නිපුණතා* |
|---|---|
| තහඩු වැඩකරු (බෙලෙක් වැඩකරු ) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් තහඩු/බෙලෙක් වැඩ පිළිබඳව ලබාගෙන තිබීම. |
| පින්තාරුකරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් පින්තාරු ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |
| ලියවන පට්ටල්කරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලියවන පට්ටල් ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |
| සවිකරන්නා | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් සවිකිරීම් පිළිබඳව ලබාගෙන තිබීම. |
| යන්ත්‍රකරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් යකඩ කැපීම, ලියවීම පිළිබඳව ලබාගෙන තිබීම. |
| කම්මල්කරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් කම්මල් වැඩ පිළිබඳව ලබාගෙන තිබීම. |
| නඩත්තු හා මෙහෙයුම් කම්කරු | මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන කුඩා යන්ත්‍රෝපකරණ යොදා වැව් බැම්ම, ඇළ මාර්ග හා වාරි පද්ධති අදාළ ප්‍රමිතීන්ට අනුකූලව නඩත්තු කිරීම හා එම යන්ත්‍ර නඩත්තු කිරීම, ජලය නිකුත් කිරීමට අදාළ පාලන නිර්මිතවල කෙරෙන නඩත්තු වැඩ නිර්මිතවල ගේට්ටු ක්‍රියාත්මක කිරීම වශයෙන් තනතුරට පැවරෙන වැඩ කටයුතුවලට සමාන වැඩ කටයුතු පිළිබඳව පිළිගත් ආයතනයක මාස 6ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබා තිබීම. |
| ජල පොම්ප ක්‍රියාකරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ජල පොම්ප ක්‍රියාකරණය පිළිබඳව හෝ මෝටර් කාර්මික ශිල්පය පිළිබඳව මාස 03කට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම. |
| පෙදරේරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ පෙදරේරු වෘත්තිය පිළිබඳ මාස 06ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබා තිබීම. |
| වඩු කාර්මික | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ වඩු කාර්මික වෘත්තිය පිළිබඳ මාස 06ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබාගෙන තිබීම. |
| ජලනළ කාර්මික | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ ජලනල කාර්මික ශිල්පය පිළිබඳ මාස 06ට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම. |

| *තනතුරු නාමය* | *තනතුරට අදාළ ශිල්පීය නිපුණතා* |
|---|---|
| උපකරණ ශිල්පී | ජාතික තාක්ෂණ සහතික විභාගය (NCT) හෝ ඒ හා සමාන විභාගයකින් සමත්වී තිබීම හා ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක වසර 02කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. |
| උපකරණ අලුත්වැඩියාකරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ උපකරණ අලුත්වැඩියාව පිළිබඳ මාස 06ට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම |
| ජල විද්‍යා මිනුම් සහයක | රජයේ හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ඉංජිනේරු සමාගමක කාලගුණික උපකරණ කියවීම (වර්ෂාමාණ ආදිය) සම්බන්ධයෙන් හෝ මිනින්දෝරු කම්කරුවකු වශයෙන් අවම වශයෙන් අවුරුදු 03ක පළපුරුදු සහතිකයක් ලබා තිබීම. |
| සංචාරක බංගලා භාරකරු | හෝටල් පාසල මගින් ගෘහ පාලනය හෝ සූප ශාස්ත්‍රය පිළිබඳව පවත්වන මාස 06ක පාඨමාලාවක් හදාරා ලත් සහතිකය;<br>*හෝ* |
| | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් පවත්වන ගෘහ පාලනය හෝ සූපවේදය පිළිබඳ මාස 06ක පාඨමාලාවක් හදාරා ලත් සහතිකය; |
| | *හෝ*<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ ගෘහ පාලනය හා සූපවේදය පිළිබඳව මාස 06ක පාඨමාලාවක් හදාරා තිබීම |
| ගබඩා කම්කරු (ගබඩා සහයක) | ගබඩා ද්‍රව්‍ය පරිගණකගතකර, ගබඩා දත්ත පහසුවෙන් ලබා ගැනීමට බලාපොරොත්තුවන නිසා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක ශිල්පීය නිපුණතා සහතිකයක් ලබා තිබීම. |
| වැද්දුම්කරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් වැද්දුම් ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |

6.3 පළපුරුද්ද - තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

6.4 කායික සුදුසුකම්: -

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.5. වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරුවන් 05 හා 06 වන ඡේදවල සඳහන් සුදුසුකම් **<u>2025 ඔක්තෝබර් මස 26 දින හෝ ඊට පෙර</u>** සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේනම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඇමිණිය යුතුය.

**7. අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :**

I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21x29 ( A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1 සිට 3 දක්වා පළමු පිටුවේද, අංක 4 සිට 5 දක්වා දෙවන පිටුවේ ද, අංක 6 සිට 8 දක්වා තෙවන පිටුවේ ද, අංක 9 සිව්වන පිටුවේ ද ඇතුළත්වන පරිදි ඉල්ලුම්පත්‍ර සැකසිය යුතු ය.

II. අයදුම්පත් සකස් කළ යුත්තේ තමා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් පමණි.

III. තනතුරු එකකට වැඩි ප්‍රමාණයක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

IV. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී එක් අයදුම්පතක් සඳහා අයදුම්පත් හා සම්මුඛ පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 500/- ක මුදලක් ගෙවීම අනිවාර්යය වේ. එය ලංකා බැංකුව, රෝහල පාර, කොළඹ 01, තැපැල්ඝාභේන් ශාඛාවේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 7042385 දරන ගිණුමට බැරවන පරිදි ගෙවා රිසිට්පත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතු ය.

V. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

VII. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නිකුත් කරන ලිපි අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VIII. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවාගෙන යොමු කළ යුතු ය.

IX. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව **"වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ................තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2025"** යනුවෙන් පැහැදිලිව සඳහන් කර **<u>2025 ඔක්තෝබර් මස 26 දින හෝ ඊට පෙර</u> වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අංක 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතු ය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අයදුම්පත්‍රය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් පත්වීම අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**9. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම :**

**<u>2025 නොවැම්බර් මස කොළඹ දී</u>** පමණක් සිංහල හා දෙමළ මාධ්‍යවලින් සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ඉංජි. අජිත් ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2025 සැප්තැම්බර් මස 25 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ..................(III) තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2025**

**The Application for the Open Basis Recruitment to the Post of ............................ (III) in the Irrigation Department -2025**

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය:
සිංහල - 1
දෙමළ - 2

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : ..........................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම : ..........................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

1.6 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ස්ත්‍රී 1
පුරුෂ 2

2.0 2.1 ස්ථිර ලිපිනය :..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :..........................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය :
(i) සිංහලෙන් / දෙමළෙන් : ...........................................................................................
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ..........................................................................................

2.4 දුරකථන අංකය : පෞද්ගලික .....................................................

3.0 3.1 විවාහක / අවිවාහක බව:

විවාහක -2 අවිවාහක -1

3.2 උපන් දිනය :
අදාළ කොටුව තුළ ලියන්න.

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස : ........................

| වර්ෂ | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ?
..........................................................................................

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස.(සා/පෙ) විභාගය :
i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය : .......... මාසය : ..........
ii. විභාග අංකය : .........................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස.(සා/පෙ) විභාගය :
i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය : .......... මාසය : ..........
ii. විභාග අංකය : .........................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.3 වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

5.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න )

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න…..........................................................................................
..........................................................................................

6.0 මුදල් ගෙවීම් කුවිතාන්සිය :

කුවිතාන්සි අංකය :............................................... දිනය :................................................

| |
|---|
| කුවිතාන්සිය මෙහි අලවන්න |

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි පාඩුව විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ මාගේ අයදුම්පත්‍රය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි.

(ඇ) මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට පෙර නුසුදුස්සකුවන බවත්, පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : .........................

..........................................
අයදුම්කරුගේ අත්සන

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ..................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

......................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

දිනය : .........................
සහතික කරන නිලධාරියාගේ නම : .............................................
තනතුර : ...........................................................
ලිපිනය : ...........................................................

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
(දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණක් අදාළ වේ.)

...............................................................................මයා/මිය/මෙනවිය,................................................. සේවයේ නියුතු .................................................................... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත්, ................................................... සේවයෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය : ..........................................

09 - 296

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 – 2006 A) මනෝ වෛද්‍ය සමාජ සේවක නිලධාරි II ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2025

1.0. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනයවන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 –2006 A) ට අයත් මනෝ වෛද්‍ය සමාජ සේවක නිලධාරි තනතුරේ II ශ්‍රේණියේ තනතුරු 07 ක් සඳහා සීමිත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

3.0. පවත්නා පුරප්පාඩු මත පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/ නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම්වරයා වෙත බලය ඇත.

4.0. භාෂා මාධ්‍ය :

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0. බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :

5.1 *අධ්‍යාපන සුදුසුකම්-*
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව /සමාජ මානව විද්‍යාව /මනෝ විද්‍යාව හෝ සමාජ වැඩ පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

5.2. *පළපුරුද්ද-*
සේවයේ ස්ථිර කර ඇති, පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරණ සහ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ වසර පහ (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරණ MN- 04- 2006A වැටුප් කේතය යටතේ වැටුප් ලබන රාජ්‍ය සේවයේ නිලධාරියෙකු වීම.

5.3. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.4. *වෙනත් සුදුසුකම්* :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවනු ලබන දිනය වනවිට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සටහන :

1. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුවේ. මෙහි දී සතුටුදායක සේවය යන්නෙන් පහත කරුණු අදහස් වේ.

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ දී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම;

හා

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වූ වර්ෂ 05ක් තුළ දී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

2. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම්, ඔහු/ඇය මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාව තිබිය යුතුය.

3. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

6.0. වයස් සීමාව - අදාළ නොවේ.

7.0. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය -

රු.58, 660 – 10 x 1190 – 11 x 1360 x 15 x 1670 – රු. 110,570 (MN– 05-2025(ඒ)) වේ.

8.0. ලිඛිත පරීක්ෂණය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශ | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. විෂයානුබද්ධ පරීක්ෂණය | ඒ ඒ තනතුරට අදාළව ක්ෂේත්‍රගත සාමාන්‍ය විෂයය කරුණු සහ ප්‍රායෝගික යෙදීම් යන කරුණු සම්බන්ධයෙන් හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ. | පැය 02 | 100 | 40% |
| 02. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 01 | 100 | 40 % |

9.0. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 (II) ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කල යුතුය.

IV. මෙම පත්වීම අවුරුදු 01 ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, MN-05 -2006 ඒ, බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විධිවිධානවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, යටත් වේ.

10.0. අයදුම්පත් ඉදිරිපත් කිරිම :

I. ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත්, 02 පිටුව අංක 07 සිට 09 දක්වාත් අනෙකුත් කරුණු ඊළඟ පිටුවලටදවන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

II. සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියක් විසින්ම මුද්‍රණය කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත බාර දිය යුතු අතර, ඔහු/ඇය විසින් සෑම අයදුම්කරුවකු/අයදුම්කාරියකම ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට පුද්ගලිකව සහතික කර ගැනීමෙන් පසු, සියලු අයදුම්පත් අධ්‍යක්ෂ (පාලන) අංක 07,සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් **2025.10.24** දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "මනෝ වෛද්‍ය සමාජ සේවක තනතුර (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. විභාග ගාස්තුව රු.1,000.00 කි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ "සෞඛ්‍ය ලේකම්වරයා" නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා

බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙ හි ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතුය. ( මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

11.0. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
I. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
II. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12.0. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13.0. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ -10

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

***සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මනෝ වෛද්‍ය සමාජ සේවක II ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2025***

විභාගය සඳහා ඉදිරිපත්වන මාධ්‍යය (සිංහල - S/ ඉංග්‍රීසි - E/ දෙමළ -T) [ ] පදිංචි දිස්ත්‍රික්කය [ ]

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./Mrs./Miss.....................................................

.........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) -: උදා : Mr../~~Mrs./Miss~~. SILVA A.B.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) -: ........................................................................... ...........................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) -: ........................................................................... ...........................................................................

02. 2.1 ලිපිනය (පෞද්ගලික) -: ...........................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) . ...........................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) (සිංහලෙන්/දෙමළෙන්) -: ........................................................................... ...........................................................................

2.3 ලිපිනය (රාජකාරි) -: ..............................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................

2.4 ලිපිනය (රාජකාරි) -: ..............................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..............................................................................
( ලිපිනයෙ හි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය.)

2.5 දුරකථන අංකය (පෞද්ගලික) :-..............................................................

2.6 දුරකතන අංකය (කාර්යාලයීය) :-..............................................................

2.7 විද්‍යුත් ලිපිනය (email Address) :-...........................................................

03. 3.1 උපන් දිනය-:

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

වර්ෂය මාසය දිනය

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස -: අවු :....................මාස :.................... දින :................

04. ජාතික හැඳුනුම්පත් අංකය -: ...........................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය -: .........................................................

06. සුදුසුකම්-:

6.1 අදාළ අධ්‍යාපන සුදුසුකම් :

..............................................................................................................................

..............................................................................................................................

6.2. වෘත්තීය සුදුසුකම් :

..............................................................................................................................

..............................................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර : ....................................................................

7.1. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ..............................................................

7.2. ලදුපත් අංකය හා දිනය : ..............................................................

7.3. ගෙවූ මුදල : ..............................................................

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 1,000.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙ හි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගුවන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය............................ ..........................................,
අයදුම්කරුගේ අත්සන

09. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තර :

I. නිලධරයාගේ නම.........................................................................මයා/මිය/මෙනවිය

II. නිලධරයාගේ ජාතික හැඳුනුම්පත් අංක..........................................................................

III. විභාගයට අයදුම්කරන අවස්ථාවේ දී දැරූ තනතුර ..........................................................

IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අඛණ්ඩ අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? .........................
..................................................................................................

V. තනතුරේ ස්ථිර කරමින් ස්ථිර කිරීමේ ලිපියක් නිකුත් කර තිබේද? එසේ නම් එම ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න..........................................................................

VI. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර වර්ෂ 05 ක කාලයේ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේ ද?...................
එසේනම් එහි ස්වභාවය.......................................................................................................................................
.....................................

VII. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර වර්ෂ 05 ක කාලය තුළ දී විනයානුකූලව දඬුවමකට යටත්කොට තිබේ ද?..................................................(‘ඔව්’ නම් විස්තර සපයන්න.) ..............................................................
.....................................................

VIII. දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේ ද?............................................................

(‘ඔව්’ නම් විස්තර සපයන්න)...............................................................................................

IX. උසාවියක් ඉදිරියේ නිලධරයා කිසියම් චෝදනාවකට වරදකරු වී තිබේ ද ? ..................................

(‘ඔව්’ නම් විස්තර සපයන්න)...............................................................................................

10. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම ඉල්ලුම්කරුවන ............................................................................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .............................................වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. පසුගිය වසර .................ක කාලය තුළ ඔහු/ ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද ඔහු/ ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර ) යටත්කොට නොමැති බව ද ඉහත සඳහන්කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂාකර බැලූ බව ද ඒවා නිවැරදි බවත් ඔහු /ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු

ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/ නොහරින බව ද.................................................................... දින ඔහු /ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවද සහතික කරමි.

..........................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :-.......................................................................................................................
තනතුර :-...................................................................................................................
දිනය: -.......................................................................................................................
දෙපාර්තමේන්තුව / ආයතනය :-..................................................................................
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

09-240/1

---

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි බණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 – 2006 A) මනෝ වෛද්‍ය සමාජ සේවක නිලධාරි II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025

1.0. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනයවන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි බණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 – 2006 A) ට අයත් මනෝ වෛද්‍ය සමාජ සේවක නිලධාරි තනතුරේ II ශ්‍රේණියේ තනතුරු 26 ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

3.0. පවත්නා පුරප්පාඩු මත පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/ නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම්වරයා වෙත බලය ඇත.

4.0. *භාෂා මාධ්‍ය* :

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.0. මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

5.1 *මූලික සුදුසුකම්* :

(I) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(II) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(III) අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වනවිට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.2 *අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව/සමාජ මානව විද්‍යාව/ මනෝ විද්‍යාව හෝ සමාජ වැඩ පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

5.3 *කායික සුදුසුකම්*

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6.0. වයස් සීමාව :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

7.0. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු.58, 660 – 10 x 1190 – 11 x 1360 x 15 x 1670 – රු. 110,570 (MN– 05-2006 ඒ) වේ.

8.0. ලිඛිත පරීක්ෂණය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශ* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01. විෂයානුබද්ධ පරීක්ෂණය | ඒ ඒ තනතුරට අදාළව ක්ෂේත්‍රගත සාමාන්‍ය විෂය කරුණු සහ ප්‍රායෝගික යෙදීම් යන කරුණු සම්බන්ධයෙන් හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ. | පැය 02 | 100 | 40% |
| 02. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යාව හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 01 | 100 | 40% |

0.9. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 (II) ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතුය.

IV. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, MN-05 -2006 ඒ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විධිවිධාන වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

10.0. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 පිටුව අංක 07 සිට 09 දක්වාත් අනෙකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

II. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2025.10.24** වේ. අයදුම්පත් **2025.10.24** වැනි දිනට හෝ එදිනට ප්‍රථම අධ්‍යක්ෂ (පාලන) 07, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "මනෝ වෛද්‍ය සමාජ සේවක තනතුර (විවෘත) බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුයි.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. විභාග ගාස්තුව රු.1000.00/= කි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ " සෞඛ්‍ය ලේකම් " නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතුය. ( මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

VI. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාර වරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදා අධිකාරීලත් නිලධාරියකු , පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 273,060/= කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

VII. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

VIII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

11.0. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12.0. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 13 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ -10.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මනෝ වෛද්‍ය සමාජ සේවක II ශ්‍රේණියේ තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025**

විභාගය සඳහා ඉදිරිපත්වන මාධ්‍යය : (සිංහල - S/ ඉංග්‍රීසි - E/ දෙමළ -T) [ ] පදිංචි දිස්ත්‍රික්කය : [ ]

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :Mr./Mrs./Miss....................................................

.............................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: -:Mr../~~Mrs./Miss~~. SILVA A.B.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) -: ........................................................................................
........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) -: ........................................................................................
........................................................................................

02. 2.1 ලිපිනය (පෞද්ගලික) -: ........................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) . ........................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) (සිංහලෙන්/දෙමළෙන්) -: ........................................................................................
........................................................................................

2.3 ලිපිනය (රාජකාරී) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) -: ........................................................................................
........................................................................................

2.4 ලිපිනය (රාජකාරී) (සිංහලෙන්/දෙමළෙන්) -: ........................................................................................
........................................................................................
( ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය.)

2.5 දුරකථන අංකය (පෞද්ගලික) :-..........................................................

2.6 දුරකතන අංකය (කාර්යාලයීය) :-..........................................................

2.7 විද්‍යුත් ලිපිනය (email Address) :-..........................................................

03. 3.1 උපන් දිනය-:

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස -: අවු :....................මාස :.................... දින :...............

04. ජාතික හැඳුනුම්පත් අංකය -: ..........................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය -: ..........................................................

06. සුදුසුකම්-:

6.1 අදාළ අධ්‍යාපන සුදුසුකම් :

.......................................................................................................................................

.......................................................................................................................................

6.2. වෘත්තීය සුදුසුකම් :

.......................................................................................................................................

.......................................................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :- ................................................................

7.1. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : - ............................................................

7.2. ලදුපත් අංකය හා දිනය :- ............................................................

7.3. ගෙවූ මුදල :- ............................................................

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 1,000.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගුවන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් කිසිම වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

දිනය.............................                                        ..........................................,
අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී.....................................දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

..........................................,
සහතික කරන්නාගේ අත්සන.
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

සම්පූර්ණ නම :.........................................................................................................
තනතුර : ........................................................................................................
ලිපිනය : .........................................................................................................

10. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.)

මෙම ඉල්ලුම්කරු වන ......................................................................................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ ආයතනයේ ...........................................වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද .............................. දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මින් සහතික කරමි. නොමැති බව ද ඉහත සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති

වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බව ද ඒවා නිවැරදි බවත් ඔහු /ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/ නොහරින බව ද.................................................................. දින ඔහු /ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

...........................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :-.......................................................................................................................
තනතුර :-..................................................................................................................
දිනය: -.......................................................................................................................
දෙපාර්තමේන්තුව / ආයතනය :-...................................................................................
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

09-240/2

---

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙහි
භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (සිංහල/දෙමළ) හා (දෙමළ/ඉංග්‍රීසි) II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය - 2025

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක (දෙපාර්තමේන්තුගත) II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා විසින් **2025 නොවැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ (www.languagesdept.gov.lk) පළ කර ඇති අතර, අයදුම්පත ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට පමණි.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025 ඔක්තෝබර් මස 28** දින වේ.

02. ඒ අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක (දෙපාර්තමේන්තුගත) - II ශ්‍රේණියේ තනතුරු සඳහා පහත සඳහන් භාෂා ප්‍රවර්ගයන්ට අදාළව බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | බඳවා ගන්නා සංඛ්‍යාව |
|---|---|
| භාෂා පරිවර්තක (සිංහල - දෙමළ) | 07 |
| භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි) | 06 |
| භාෂා පරිවර්තක (දෙමළ - ඉංග්‍රීසි) | 04 |

03. බඳවා ගැනීමේ ප්‍රතිශතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 75% |
| සීමිත | 25% |
| කුසලතා | අදාළ නොවේ |

**සටහන** : විවෘත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව සීමිත ධාරාව යටතේ පුරවනු ලැබේ. සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ අදාළ සුදුසුකම් අනුව පුරවනු ලැබේ.

04. පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. **කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.**

05. තනතුරට පත් වී වසර තුනක් (03) ගතවීමට පෙර පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

06. ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරන ලද භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතුවේ.

07. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 සහ 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතීන්ට සහ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනේ.

08. සියලු ම බඳවා ගැනීම්, අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට හා ඉදිරියේ දී එම බඳවා ගැනීමේ පටිපාටියට කරනු ලබන සංශෝධනයන්ට යටත් වේ.

09. මාසික වැටුප් පරිමාණය: රු.62,230 - 10 x 1,190 -11 x 1,360 -15 x 1,670 - රු. 114,140/- (MN-6-2025).

10. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන

ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය

11. සුදුසුකම් : භාෂා පරිවර්තක (සිංහල/දෙමළ), (සිංහල/ ඉංග්‍රීසි) සහ (දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා විවෘත/සීමිත පදනමින් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ :-

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි):

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

*සහ*

II. අ.පො.ස. (සා/පෙළ) හෝ ඊට සමාන විභාගයක දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

III. සිංහල/ඉංග්‍රීසි භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්විය යුතු ය.

භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි):

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

*සහ*

II. අ.පො.ස. (සා/පෙළ) හෝ ඊට සමාන විභාගයක දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

III. දෙමළ/ඉංග්‍රීසි භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්විය යුතු ය.

භාෂා පරිවර්තක (සිංහල /දෙමළ) :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

*සහ*

II. අ.පො.ස. (සා/පෙළ) හෝ ඊට සමාන විභාගයක දී සිංහල හා දෙමළ භාෂාවට හර විෂයක් සේ පෙනී සිට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ අනෙක් භාෂාව පිළිබඳ දෙවන බස මට්ටමේ සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් සමඟ පළමු වැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

III. සිංහල/දෙමළ භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

11.1. කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

11.2. වෙනත් :
I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. සීමිත ධාරාව යටතේ අයදුම්කරන අයදුම්කරුවන් දැනට රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර පත්වීම් දරන, එම පත්වීම් ස්ථිර කරනු ලැබ සිටින නිලධාරින් විය යුතු ය.

12. වයස් සීමාව :

විවෘත : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

සීමිත : වයස් සීමාව අදාළ නොවේ

**සැළකිය යුතුයි** : සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2025** ඔක්තෝබර් මස **28** දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත විභාගයක සහ ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කෙරේ.

13.1 ලිඛිත විභාගයෙන් සමත්වන සියලුම අයදුම්කරුවන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම ලිඛිත විභාගයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

14. විභාග පරිපාටිය :

14.1 විභාගයේ විෂය නිර්දේශය:

**සටහන** : මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වෙන අතර, අයදුම්කරුවන් තෝරා ගනු ලබන භාෂා ප්‍රවර්ගය අනුව මාධ්‍ය තීරණය වේ. ඒ අනුව භාෂා මාධ්‍ය සහ අයදුම්කරු විසින් තෝරා ගනු ලබන භාෂා ප්‍රවර්ගය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි) | 1.පරිවර්තනය-සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | • පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 2.පරිවර්තනය-ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | • පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 3. සිංහල භාෂාව | • රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |
| | 4. ඉංග්‍රීසි භාෂාව | • රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම |
| භාෂා පරිවර්තක (දෙමළ/ ඉංග්‍රීසි) | 1.පරිවර්තනය-දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | • පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 2.පරිවර්තනය-ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | • පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 3. දෙමළ භාෂාව | • රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |
| | 4. ඉංග්‍රීසි භාෂාව | • රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1.පරිවර්තනය-සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | • පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 2.පරිවර්තනය-දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | • පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගත් ඡේද 03ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 3. සිංහල භාෂාව | • රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |
| | 4. දෙමළ භාෂාව | • රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |

14.2 ලකුණු ලබා දෙන ආකාරය :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| භාෂා පරිවර්තක ( දෙමළ /ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40% |

- ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 25 ක් ලබා දෙන අතර සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 12 ක් වත් ලබා ගත යුතු ය.

14.3. විභාග කොන්දේසි :-

14.3.1 මෙ සඳහා වන අයදුම්පත්‍රය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ (https://www.languagesdept.gov.lk) පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට පමණි.

14.3.2 මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 28 වැනි දින ප.ව. 2.00** ට අවසන් වේ.

14.3.3 මාර්ගගත අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14.3.4 එසේ යොමු කරනු ලබන අයදුම්පත්‍රය මුද්‍රණය කර අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු අතර, දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් හෝ ආයතන ප්‍රධානියා මගින් බලය පවරනු ලබන ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු මගින් පමණක් සහතික කළ යුතුය.

14.3.5 එසේ සහතික කරන ලද අයදුම්පත ලිඛිත විභාගය සඳහා කැඳවීමේ දී රැගෙන ආ යුතු අතර, ගෙවීම් කරන ලද ලදුපත ද සමග විභාග ශාලාධිපතිට හෝ බලය පවරනු ලබන නිලධාරියකු හට ලබා දීමට කටයුතු කිරීම අනිවාර්ය වේ.

14.3.6 එක් අයදුම්කරුවකුට අයදුම්කළ හැක්කේ එක් භාෂා ප්‍රවර්ගයකට (සිංහල/දෙමළ හෝ සිංහල/ඉංග්‍රීසි හෝ දෙමළ/ ඉංග්‍රීසි ) පමණි.

15. *විභාග ගාස්තු*.- විභාග ගාස්තුව රු.1000/- කි. මෙම මුදල භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-99-00 යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී උඩුගත කළ යුතුය. (එහි මුල් පිටපත විභාගයට සහභාගී වනවිට තම විභාග ශාලාධිපතිට භාර දිය යුතු අතර ලදුපතෙහි මුල් පිටපත ඔබ සතුව නොමැති වුවහොත් නැවත මුදල් ගෙවීමට සිදුවනු ඇත.) කිසිම හේතුවක් නිසාවත් විභාගය සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවනු නොලැබේ.

16. විභාගයට ඇතුළත් කර ගැනීම :

අපේක්ෂකයාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් කවර හෝ ලියවිල්ලක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත; හෝ

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය; හෝ

(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

17. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහාවන දඬුවම් :

(i) අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ii) අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

18. සෑම අයදුම්කරුවෙකුට ම රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**තිලක් නන්දන හෙට්ටිආරච්චි,**
රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
අංක 341/7,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (සිංහල/දෙමළ) හා (දෙමළ/ඉංග්‍රීසි) II ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්පත්‍රය**

**Application for the Post of Translator (Sinhala/English)/ / (Sinhala/Tamil)/ (Tamil/English)**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අයදුම් කරන තනතුර :

(අදාළ අංකය සඳහන් කරන්න)

01. භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)
02. භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)
03. භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි)

(අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඉංග්‍රීසි කැපිටල් අකුරු පමණක් භාවිතා කරන්න. සඳහන් කර ඇති ස්ථානවල පමණක් සිංහල හෝ දෙමළ අකුරු භාවිතා කරන්න)

1. නම :
   1.1. මුලකුරු සමඟ නම :- Mr./Mrs. /Miss. ....................................................
   ......................................................................................................................
   1.2. සම්පූර්ණ නම :- ..............................................................................
   ......................................................................................................................
   1.3. සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :-
   ......................................................................................................................
   1.4. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2. ලිපිනය :
   2.1. ස්ථිර ලිපිනය :-
   ..............................................................................
   ......................................................................................................................
   2.2. රාජකාරි ලිපිනය :-
   ..............................................................................
   ......................................................................................................................
   2.3. රාජකාරි ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :- .......................................................
   ......................................................................................................................
   2.4. ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය :- .......................................................................
   ......................................................................................................................
   2.5. දුරකථන අංකය (ජංගම):- ....................වට්ස්අප් දුරකථන අංකය:..................................
   **සැළකිය යුතුයි** : වට්ස්අප් අංකයක් (Whats App Number) අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.
   2.6. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..............................................................
   2.7. පදිංචිව සිටින කාලසීමාව :- ..................................................................
   2.8. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- ..................................................................

3. 3.1. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී -1 පුරුෂ - 0 [ ] (අදාළ අංකය ලියන්න)
   3.2. විවාහක / අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 [ ] (අදාළ අංකය ලියන්න)
   3.3. උපන් දිනය :- වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]
   3.4. 2025.10. 28 දිනට වයස :- අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

4. අධ්‍යාපන සුදුසුකම් : ................................................
   4.1.a). උපාධිය : ................................................
   b). උපාධිය ලබා ගත් වර්ෂය හා විශ්වවිද්‍යාලය : ................................................
   c). උපාධියට හැදෑරූ විෂයයන් : ................................................

4.2. අ.පො.ස.(උ.පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : ............................................
(ii) විභාග අංකය : ............................................
(iii) ප්‍රතිඵල : ............................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3. අ.පො.ස.(සා.පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : ............................................
(ii) විභාග අංකය : ............................................
(iii) ප්‍රතිඵල : ............................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

ඔව් නම් ඒ පිළිබඳ තොරතුරු : ...............................................................

6. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

............................. ......................................
දිනය අයදුම්කරුගේ අත්සන

**(පෞද්ගලික අයදුම්කරුවන් සඳහා)**

**අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ...................................... ................................ නමැති අය මා පෞද්ගලිකව හොඳින් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී ...................දින අත්සන් තබන ලද බවත් සහතික කරමි.

දිනය ................................................... ...............................................

සහතික කරන්නාගේ අත්සන
නම :
තනතුර :
නිල මුද්‍රාව:

(දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................................... මයා / මිය / මෙනවිය .............................. දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත සඳහන් තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් 2025 .................... මස ........ දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය/නොහැකිය.

දිනය : ...................

..................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම :
තනතුර :
නිල මුද්‍රාව:

(ලදු පත මෙහි අලවන්න)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| **විභාග ගාස්තු ගෙවීමේ තොරතුරු :** | |
| ජාතික හැඳුනුම්පත් අංකය | |
| අයදුම්පත් අංකය | |
| ගෙවීම් කළ දිනය | |
| විභාගයේ නම | |
| විභාග ගාස්තුව | |

09-273

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**වෘත්තීය අධ්‍යාපන අංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

***පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2026 ජනවාරි කණ්ඩායම***

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

මෙම සියලුම පාඨමාලාවන් දේශීය සහ විදේශීය රැකියා අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ඉතා උසස් මට්ටමේ න්‍යායික හා ප්‍රායෝගික කොටස්වලින් සමන්විත, ආධුනිකයාට ක්ෂේත්‍රය පිළිබඳ අවශ්‍ය වැඩිමනක් දැනුම අන්තර්ගත කොට සැකසූ දිවයිනේ ප්‍රමුඛතම පාඨමාලාවන් වේ.

- කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය මගින් පිරිනැමෙන පූර්ණ කාලීන පාඨමාලා සහතිකය සහ ඊට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිරිනැමෙන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 04 මට්ටම) සහතිකය ද හිමිවේ.

1. පවත්වනු ලබන පාඨමාලා :

| | *පාඨමාලා විස්තර* | *පාඨමාලා ගාස්තුව රු.* | *කාලය* |
|---|---|---|---|
| 01, 02, 03, 04, 05, වෘත්තීන් සඳහා අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6 ක් සමත් වී තිබීම හෝ අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම. | | | |
| 01. | **ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) - Electronics Craftsman (Special)**<br>(Basic Work Shop Practice, Domestic Electrical Installation, Analogue & Digital Electronics with Applications, Communication Systems, Thyristor Power Control, PLC and Micro Controller and Based Control Systems (PIC & ARDUINO), Solar Power Systems & Project Works) | 150,000 | අවු. 03 |
| 02. | **විදුලි කාර්මික ශිල්පී (විශේෂ) - Electrician (Special)**<br>(Basic Work Shop Practice, Domestic & Industrial Electrical Circuits, Electrical measuring Instrument, Communication & Security System, Electrical Machine & Motor Control System, Pneumatic & Electro Pneumatic Control System, Mechatronics Systems, Electrical Technology & Electrical Mathematics) | 150,000 | අවු. 03 |
| 03. | **ඉදිකිරීම් සුපරීක්ෂක - (Construction Supervisor)**<br>(Construction Management, Basic Workshop Practice, Basics in Construction Technology, Basics in Engineering and Architectural Drawings and Auto Cad, Construction Materials, Surveying and Levelling, water Supply, Drainage and Sewerage Systems, Road Construction and Quantity Surveying and Cost Estimates) | 100,000 | අවු. 01 1/2 |
| 04. | **ප්‍රමාණ සමීක්ෂණ සහකාර -(Quantity Surveying Assistant),**<br>(Preparation of BOQ for small and medium construction, Pricing of BOQ, Prepare Bidding Document) | 50,000 | අවු.01 |
| 05. | **සැලසුම් ශිල්පී -** Draughtsperson<br>(Building Construction, Building Services, Mathematics, Geometrical and Mechanical Drawings, Surveying and Levelling, Auto CAD, Electrical and Plumbing Drawings, Drawing Office activities, Building Services Drawings) | 80,000 | අවු. 01 1/2 |
| **06, 07, වෘත්තීන් සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත් වීම.** | | | |
| 06. | **ශීතකරණ හා වායුසමන යාන්ත්‍රික ශිල්පී - Refrigeration & Air Conditioning Mechanic**<br>Basic Work Shop Practice, All type of refrigeration, Domestic & industrial Air Conditioning System, Refrigeration recovery & Recycling Methods | 100,000 | අවු. 02 |
| 07. | **යන්ත්‍ර ශිල්පී (විශේෂ) - Machinist (Special)**<br>Lathe, Milling, Grinding Machine Operation, Pneumatic and Hydraulic Systems, Heat Treatment, CNC Programming, CNC Machining, EDM Process, Wire Cutting Process, LASER Cutting, Solid Works, Auto Cad | 1,50,000 | අවු. 03 |
| **08, 09 වෘත්තීන් සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.** | | | |

| | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව රු. | කාලය |
|---|---|---|---|
| 08. | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - Information & Communication Technology Technician**<br>Maintaining files & folders, Performing word processing, Preparing spread sheets, Preparing presentations, Performing basic operations of cloud computing including internet and e-mail services, Performing basic database manipulation, Computer system, network and peripherals, Producing Print page Layout and multimedia objects, Systems Analysis and Designing, Perform relational databases using standard SQL, Designing static Website, Developing Desktop applications | 40,000 | අවු. 01 |
| 09. | **පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී - Computer Graphic Designer**<br>(Adobe Photoshop, Adobe Illustrator, Adobe InDesign, Printing & Scanning method, Computer Hardware & Software, Colour theory & Input images, Visual media Technology Fundamentals, Typography, Edit & manipulate images, Illustrations, Layout designing, Design layout for web & other types of multimedia. | 40,000 | අවු. 01 |
| 10 වෘත්තීය සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් සමඟ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විෂයන් 6ක් සමත් වී තිබීම. | | | |
| 10. | **ලේකම් පරිචය (ඉංග්‍රීසි මාධ්‍යය)-(Secretarial Practices (English Medium)**<br>(Practice workplace communication & interpersonal relations, Apply occupational literacy & numeracy, Work in teams, Practice occupational health and safety measures, Handle mail, Handle correspondence, Build & maintain relationships with clients/organizations, Coordinate meetings, Make travel arrangements, Develop & maintains a filling systems, Maintain diary & appointments, Manage the office, Computer Application Software, English Typing & Shorthand | 80,000 | අවු. 01 1/2 |
| **11, 12, 13, 14, 15 වෘත්තීන් සඳහා අවම වශයෙන් අ.පො. ස. (සා. පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම.** | | | |
| 11. | **පෑස්සුම් ශිල්පී (විශේෂ)**- Welder (Special )<br>(MMA/GAS/TIG/MIG/MAG/FCAW/PLASMA/SPOT/STUD Welding ශිල්පීය ක්‍රම, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe weld) | 1,50,000 | අවු. 03 |
| 12. | **මුද්‍රණ නිමැවුම්කරු - Print Finisher**<br>Hard Binding, නැවත පොත් බැඳීම (Rebinding), කොළ නැවුම් යන්ත්‍ර (Folding Machine), කොළ එකතු කිරීමේ යන්ත්‍ර,(Gathering Machine) පොත් මහන යන්ත්‍ර (Sewing Machine), වයර් මැස්ම (Wire Stitching), Perfect Binding/Cover Pasting Machine, කඩදාසි කපන යන්ත්‍ර (Guillotine Machine), කඩදාසි කපන යන්ත්‍ර, (3 Knife Trimmer), Die Cutting/Embossing/Debossing Machine, Foiling Machine, ලැමිනේටින් යන්ත්‍ර, UV වාර්නිෂ්, Cartoon Pasting/Folder gluing Machine | 15,000 | අවු. 01 1/2 |
| 13. | **ඔෆ්සෙට් යන්ත්‍ර ක්‍රියාකරු - Offset Machine Operator**<br>Perform basic functions of offset machine, Make ready and print on offset machine, Maintain offset machine, Perform advance functions of sheet fed/web offset machine printing, Practice workplace communication and interpersonal relations, Apply occupational literacy and numeracy, work in teams, Practice Occupational health and safety measures. | 15,000 | අවු. 01 |
| 14. | **දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ සහ ගොඩනැගිලි)** - Carpenter (Furniture and Building)<br>අත් ආවුද භාවිතය සහ මූලික දැව මූට්ටු වැද්දීම හා නවීන යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය කොට දැව සහ සංයුක්ත දැව මගින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, අත් ආවුද සහ යන්ත්‍ර තල මුවහත් තැබීම හා නඩත්තුව, නවීන ආවුද හා උපකරණ භාවිතයෙන් ගෘහ භාණ්ඩ නිමහම් කිරීම (පොලිෂ් කිරීම), දැව තාක්ෂණය පිළිබඳ න්‍යායික දැනුම, කාර්මික ඇඳීම හා කාර්මික ගණිතය භාවිතයෙන් ඇස්තමේන්තුව පිළියෙල කිරීම, වහල, සිවිලිම ඉදිකිරීම, උළුවහු, දොරජනෙල් සෑදීම, පඩිපෙළ බිම්ලෑලි ඇතිරීම, බෙදුම්කඩ ඉදිකිරීම, ෂටරින් සැකසීම | 20,000 | අවු. 02 |

| | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව රු. | කාලය |
|---|---|---|---|
| 15. | **ඇලුමිනියම් පිරිසැකසුම්කරු - Aluminium Fabricator**<br>ඇලුමිනියම් ජනෙල් සහ දොරවල් සෑදීම, බෙදුම්කඩ (Partitions) කඩසාප්පු දොර සහ බිම්කඩ වෙන් කිරීම, ඉනිමං ඉදිකිරීම්, Glass & Tempered Glass සවිකිරීම, ප්‍රදර්ශන කබඩ් සෑදීම, නාන කාමර වෙන් කිරීම (Shower cubicles) ඇතුළත දොර ඉදිකිරීම් සහ සවිකිරීම (Roller doors) ඇලුමිනියම් සිවිලිම ඉදිකිරීම සහ සවිකිරීම, වෙනත් ඇලුමිනියම් උපාංග සවිකිරීම) | 20,000 | අවු. 01 |
| 16. | **බහුකුසලතා කාර්මික ශිල්පී - Multi Skilled Technician**<br>Masonry works, Plumbing works, Carpentry works, Electrical works, Maintenance of air Conditioning, Basic aluminium fabrication works, Work place Communication, Occupational literacy, Occupational Health and Safety. | 40,000 | අවු. 01 1/2 |
| **16, වෘත්තිය සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබීම** | | | |
| 17. | **ජලනළ කාර්මික ශිල්පී** - Plumber<br>දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතා වන PVC, CPVC, GI, PB, PPR නල වර්ග සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය සහ සැලසුම් නිර්මාණය හඳුනා ගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම | 60,000 | අවු. 02 |

- පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවීම් කළ හැක.

02. **වයස** : 2025.10.31 වැනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

03. **පුහුණුව පිළිබඳ විස්තර** :

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැලසුම් කර සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම් කටයුතු සිදුකරන අතර වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ද, පුහුණුවේ දෙවන භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පිළිගත් පෞද්ගලික ආයතනවල කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් බහුලවන අතර, සියලුම පාඨමාලාවන් සඳහා ඉංග්‍රීසි භාෂා දැනුම ලබාදෙනු ලැබේ.

04. **තෝරා ගැනීමේ ක්‍රමය** :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

05. **ප්‍රතිලාභ** :

5.1 දුර අනුව නේවාසිකාගාර පහසුකම් (පිරිමි ළමුන්ට පමණයි);
5.2 පුස්තකාල පහසුකම්;
5.3 සහන මිලට ආහාරපාන;
5.4 සහන මිලට ශ්‍රීලංගම වාර ප්‍රවේශපත්‍ර
5.5 අඩු ආදායම්ලාභී පවුල්වල ආධුනිකයන්ට රු. 5000 මාසික දීමනා

06. අයදුම්පත් එවිය යුතු ආකාරය :

6.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමඟ **2025.10.31** වැනි දිනට පෙර **අධ්‍යක්ෂ/ විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ **"ආධුනිකයින් බඳවා ගැනීම 2026 ජනවාරි"** යන්න සඳහන් කළයුතු අතර, ඔබගේ නම, ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.

6.2 මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 313100153656984 ට බැර කරන ලෙස සඳහන් කරමින් ඕනෑම බැංකු ශාඛාවකට රු. 1,000 ක් ගෙවා ලබාගත් ලදුපත (අයදුම්කරුගේ නම සහ හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය) අයදුම්පතට ඇමිණිය යුතු අතර, එහි ඡායා පිටපතක් ඔබ සතුව තිබිය යුතුවේ. එසේ අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.3 එක් අයදුම්කරුවෙකු තම අධ්‍යාපන සුදුසුකම් අනුව කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

6.4 තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කළ යුතුය.

එච්. ඒ. සත්තාර්,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

ආදර්ශ අයදුම් පත්‍රය [11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ]

| | |
|---|---|
| කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව<br>Industrial Engineering Training Institute - Moratuwa<br>ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2026 ජනවාරි | Doc. No. :- ADM/TRE/FM/02 |
| | Issue No. :- 02 |
| | Issue Date :- 2019.03.14 |
| | Reviewed by :- |
| | Approved by :- |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-………………………………………………… මයා/මිය/ මෙනෙවිය.

02. මුලකුරු සමග නම :-…………………………………………………

03. ලිපිනය :-…………………………………………………

04. පදිංචිය (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-…………………………………………………

(ii) දිස්ත්‍රික්කය :-…………………………………………………

05. දුරකථන අංකය : නිවස :-…………………… ජංගම : :-……………………… Whatsapp. අංකය :-…………………

විද්‍යුත් තැපැල (ඊ-මේල්) :-……………………………

06. උපන් දිනය :-…………………………………………………

07. ජාතික හැඳුනුම්පත් අංකය :-…………………………………………………

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සලකුණු කරන්න)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ. පො. ස. (උ. පෙළ) | | අ. පො. ස. (සා. පෙළ) | | 8 ශ්‍රේණිය | |

අ.පො.ස . (සා. පෙළ) විභාගයේ ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙළින් සඳහන් කරන්න.

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :- .....................

09-259

---

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2025)

## First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics -2016 (2025)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2026 ජනවාරි** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Service” යටතේ ඇති “Online Applications – Recruitment Exams/E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 29 වැනි දින පෙ.ව. 09.00**ට විවෘතවන අතර **2025 ඔක්තෝබර් මස 24 වැනි දින රාත්‍රී 09.00**ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

• **සටහන :**

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයන් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට් පත්‍රයේ*වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. විභාග ගාස්තු : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 200/- ක විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii.) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Any Branch of Bank of Ceylon)

• **සටහන**

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

04. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව සිදු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail ) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව ( Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පතේ මුද්‍රිත පිටපත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් " විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත /විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

06.1 විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගත යුතුය.

06.3 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිප වරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය :

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1.මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2.කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 3. මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | ➢ දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රමථ ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $X^2$ පරීක්ෂා, ජාල රේඛය හා සංඛ්‍යාත වක්‍ර කේන්ද්‍රික ප්‍රවණතාව හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යයන, විචලතාව, චතුර්ථක හා සම්මත අපගමනය) නියැදුම්වාදයේ මූලධර්ම, නියැදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය, හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාව, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම<br><br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය<br>a) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විතවන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br><br>b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යවන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |
| 2 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II,III,IV,V,VIII,XII,XIII,XIV, XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛයන් පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳවද අවධානයට ගතයුතු වේ.<br><br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය<br>a) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විතවන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br><br>b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යවන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |
| 3 | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම ( මු.රෙ.1 සිට 68 දක්වා)<br><br>➢ III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම ( මු.රෙ.124 සිට 147 දක්වා)<br><br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය<br>a) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විතවන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br><br>b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යවන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |

**සටහන -**

- ➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
- ➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම ගැසට් නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

13. *මෙම නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

09-292

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.